# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2214/75 - 2021 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා - 2021.02.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ.

1. ගරු ඒ.එච්.එම්.ඩී. නවාස් මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. චන්ද්‍රා ප්‍රනාන්දු මැතිතුමා
   විශ්‍රාමික පොලිස්පති
3. නිමල් අබේසිරි මැතිතුමා
   විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්

වෙත,

ශුභාශිංසන පූර්වකවයි!

පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය) 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වර්ෂ 2021 ජනවාරි මස 20 වැනි දිනැති අධිකාරී පත්‍රය මගින් ම විසින් මානව හිමිකම් උල්ලංඝණය වීම් සම්බන්ධයෙන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවා ඇති හෙයින් ද,

තවද, මෙම කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් වඩාත් කඩිනමින් හා කාර්යක්ෂමව සපුරාලිය යුතු බව හඳුනාගෙන ඇති බැවින් ද,

තවද, ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ලක්ෂණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබිඹු වීමේ අවශ්‍යතාවය අවධානයට ලක්කරමින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව යෝගේෂ්වරී පත්කුණරාජා මැතිතුමිය, එතුමියගේ විචක්ෂණභාවය, සාමාර්ථය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, පෙරකී අධිකාරී පත්‍රය ප්‍රකාර ස්ථාපනය කරනු ලැබූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරියක ලෙස මෙයින් පත්කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 11 වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.